# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2294/29 - 2022 අගෝස්තු මස 23 වැනි අඟහරුවාදා - 2022.08.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත**

1985 අංක 48 දරන සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වන වගන්තියේ (1) වන උපවගන්තිය, 6 වන වගන්තිය සහ 14 වන වගන්තිය සමඟ කියවිය යුතු, 20 වන වගන්තිය යටතේ, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය රනිල් වික්‍රමසිංහ වන මවිසින් පනවනු ලබන රෙගුලාසි.

**රනිල් වික්‍රමසිංහ,**
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය.

2022 අගෝස්තු මස 22 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේදී ය.

**රෙගුලාසි**

1. මෙම රෙගුලාසි "**2022 අංක 12 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි**" ලෙස හඳුන්වනු ලැබේ.

2. 2021 ජුනි මස 11 දිනැති අංක 2231/18 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ලද 2021 අංක 10 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි, මෙමගින් සංශෝධනය කරනු ලැබේ.

   i. ඉහතින් සඳහන් කරන ලද 2021 අංක 10 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසිවල අංක 8 (ඈ) රෙගුලාසියට වහාම පසුව පහත ප්‍රතිපාදනය ඇතුළත් කරනු ලැබේ.

   "(ඇ) ඕනෑම සහාධිපත්‍ය හෝ අනුමත මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘති හෝ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ විෂය පථය යටතට නොවැටෙන අනුමත හෝටල් ව්‍යාපෘති හෝ රජයේ ව්‍යාපෘති (තොග ලබන්නා ) මගින්, නිම කිරීම සඳහා උළු හෝ ගල්



මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

ඇතිරීමේ අදියරෙහි ඉදිවෙමින් / ප්‍රතිසංස්කරණය වෙමින් පවතින එවැනි සහාධිපත්‍ය හෝ මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘති හෝ හෝටල් ව්‍යාපෘති හෝ රජයේ ව්‍යාපෘති සඳහා සෘජුවම යොදාගනු ලබන, සෘජු හෝ වක්‍ර විකිණීමේ අරමුණු සඳහා නොවන, මෙම ගැසට් පත්‍රයේ I වන උපලේඛනයේ ලැයිස්තුගතකර ඇති 25.15, 25.16, 68.02, 68.10, 69.05, 69.07 සහ 69.14 එච්.එස් ශීර්ෂයන් යටතේ වර්ග කර ඇති උළු / ගල්, අවම වශයෙන් දින 180 ක ණය පහසුකමක් සහිත ණයවර ලිපි (එල්.සී) හෝ පිළිගැනීම මත ලේඛන (ඩී.ඒ) ගෙවීම් ක්‍රම යටතේ ආනයනය කිරීම සඳහා, එවැනි ව්‍යාපෘතිවල ප්‍රමාණ බිල්පතේ (බී.ඕ.කිව්.) සහතික කර ඇති පරිදි උළු හෝ ගල් ප්‍රමාණයේ සීමාවට යටත්ව ආනයන හා අපනයන පාලක ජනරාල් විසින් භාණ්ඩාගාර ලේකම්වරයාගේ නිර්දේශය සහ මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය මත අවස්ථානුකූලව අවසර ලබා දිය හැකිය.”

ii. ඉහතින් සඳහන් කරන ලද 2021 අංක 10 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසිවල අංක 8 දරන රෙගුලාසියේ කෙසේ සඳහන් වුවද, රජයේ අරමුදල් භාවිතයෙන් කරනු ලබන ව්‍යාපෘති ආයතන විසින් එවැනි ව්‍යාපෘතිවල සෘජු භාවිතය සඳහා ඉදිකිරීම් වාහන ආනයනය කිරීමේ දී ආනයන හා අපනයන පාලක ජනරාල් විසින් භාණ්ඩාගාර ලේකම්ගේ නිර්දේශය මත අවසර ලබාදිය හැකිය.

iii. ඉහතින් සඳහන් කරන ලද 2021 අංක 10 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසිවල I **වන උපලේඛනයෙන්**, පහත සඳහන් භාණ්ඩ හා ඒවාට අනුරූපී සටහන් මෙයින් ඉවත් කරනු ලැබේ.

| | *I තීරුව* **ශීර්ෂ අංකය** | *II තීරුව* **සංයෝජිත වර්ගීකරණ සංකේතය** | | *III තීරුව* **විස්තරය** | *IV තීරුව* **තාවකාලික අත්හිටුවීම (TS)** |
|---|---|---|---|---|---|
| 55 | **87.11** | | | **සයිඩ් කාර් සහිත හෝ රහිත, අතිරේක මෝටරයක් සවිකළ පාපැදි සහ යතුරු පැදි (මෝපෙඩ් ඇතුළු) සයිඩ් කාර්.** | |
| | | 8711.60.00 | - | ඉදිරියට ගමන් කිරීම සඳහා වන විදුලි මෝටර් සහිත | |
| | | 8711.60.10 | --- | අවුරුදු 3 ට වඩා නොපැරණි (ආබාධිත පුද්ගලයන් විසින් භාවිත කරනු ලබන මෝටරයක් සවිකළ පාපැදි හැර) | **TS** |
| | | | | | |
| 56 | **87.12** | | | **මෝටරයක් සවි නොකළ, ද්විරෝද පාපැදි සහ (බෙදා හැරීමේ ත්‍රි රෝද පාපැදි ඇතුළුව) අනෙකුත් පාපැදි :** | |
| | | 8712.00.90 | --- | අනෙකුත් (ක්‍රීඩා සහ රේසිං බයිසිකල් හැර) | **TS** |

iv. ඉහතින් සඳහන් කරන ලද 2021 අංක 10 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි වල **I වන උපලේඛනයෙහි** III තීරුවේ දක්වා ඇති, සංයෝජිත වර්ගීකරන සංකේතාංක 2206.00.99 හා 3923.10.90 යටතේ වර්ගීකරණය කර ඇති භාණ්ඩ වලට අදාළ විස්තරයන් පහත පරිදි සංශෝධනය කර කියවිය යුතුය.

| | *I තීරුව* **ශීර්ෂ අංකය** | *II තීරුව* **සංයෝජිත වර්ගීකරණ සංකේතය** | | *III තීරුව* **විස්තරය** | *IV තීරුව* **තාවකාලික අත්හිටුවීම (TS)** |
|---|---|---|---|---|---|
| 29 | **22.06** | | | **පැසවූ හෝ අනෙකුත් පාන වර්ග (උදාහරණ වශයෙන් සයිඩර්, පෙරී, මීඩ, සකේ); පැසවූ පාන වර්ග වල මිශ්‍රනයන් සහ අන්තනක නිශ්චිත ලෙස සඳහන් නොවූ හෝ ඇතුළත් නොකළ, අමද්‍යප පාන වර්ග සහ පැස වූ පාන වර්ගවල මිශ්‍රණයන්.** | |

| | *I තීරුව* ශීර්ෂ අංකය | *II තීරුව* සංයෝජිත වර්ගීකරණ සංකේතය | | *III තීරුව* විස්තරය | *IV තීරුව* තාවකාලික අත්හිටුවීම (TS) |
|---|---|---|---|---|---|
| | | 2206.00.90 | --- | අනෙකුත් | |
| | | 2206.00.99 | ---- | අනෙකුත් (සකේ, සෝවු සහ උමේෂු හැර) | TS |
| | | | | | |
| 36 | **39.23** | | | **ප්ලාස්ටික් වලින් නිම කළ බඩු ගෙන යාම හෝ ඇසිරීම සඳහා වූ භාණ්ඩ; ප්ලාස්ටික් වලින් නිම කළ මූඩි, පියන්, මුදුන් පියන් හා වෙනත් වැසුම්** | |
| | | 3923.10.00 | - | පෙට්ටි, කොපු, විශාල ලැලි පෙට්ටි සහ ඒ හා සමාන භාණ්ඩ : | |
| | | 3923.10.90 | --- | අනෙකුත් (ප්ලාස්ටික් කුඩ සහ ප්ලාස්ටික් පැලට් හැර) | TS |

3. (i) සංශෝධිත, විශේෂ ආනයන බලපත්‍ර රෙගුලාසි පළ කරන ලද 2017 නොවැම්බර් 09 දිනැති අංක 2044/40 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ 1 වන උපලේඛනයට, පහත සඳහන් භාණ්ඩ හා ඒවාට අනුරූපී සටහන් මෙයින් ඇතුළත් කරනු ලැබේ.

| | I *තීරුව* ශීර්ෂ අංකය | II *තීරුව* සංයෝජිත වර්ගීකරණ සංකේතය | | III *තීරුව* විස්තරය | IV *තීරුව* ආනයන පාලන බලපත්‍රය (L) |
|---|---|---|---|---|---|
| 372 | **87.11** | | | **සයිඩ් කාර් සහිත හෝ රහිත, අතිරේක මෝටරයක් සවිකළ පාපැදි සහ යතුරු පැදි (මෝපෙඩ් ඇතුළු) සයිඩ් කාර්.** | |
| | | 8711.60.00 | - | ඉදිරියට ගමන් කිරීම සඳහා වන විදුලි මෝටර් සහිත | |
| | | 8711.60.10 | --- | අවුරුදු 3 ට වඩා නොපැරණි | L |
| | | | | | |
| 373 | **87.12** | | | **මෝටරයක් සවි නොකළ, ද්විරෝද පාපැදි සහ (බෙදා හැරීමේ ත්‍රි රෝද පාපැදි ඇතුළුව) අනෙකුත් පාපැදි :** | |
| | | 8712.00.90 | --- | අනෙකුත් | L |

(ii) ඉහත රෙගුලාසි අංක 3 (i) හි සඳහන් කර ඇති භාණ්ඩ අවම වශයෙන් දින 180 ක ණය පහසුකමකට යටත්ව ණයවර ලිපි (එල්.සී) හෝ පිළිගැනීම මත ලේඛන (ඩී.ඒ) ගෙවීම් ක්‍රම යටතේ ආනයනය සඳහා අවසර දෙනු ලැබේ.

4. සංශෝධිත, විශේෂ ආනයන හා අපනයන පාලන බලපත්‍ර ගාස්තු පලකරන ලද 2016 පෙබරවාරි 11 දිනැති අංක 1953/28 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* **I** වන උපලේඛනයට, පහත සඳහන් අයිතම සඳහා ගෙවිය යුතු ආනයන පාලන බලපත්‍ර ගාස්තු මෙයින් ඇතුළත් කරනු ලැබේ.

| *අනු අංකය* | *භාණ්ඩය* | *ආනයන පාලන බලපත්‍ර ගාස්තුව/එක් ඒකකයකට (රු)* |
|---|---|---|
| 85 | විද්‍යුත් යතුරුපැදි | 4,000.00 |
| 86 | පා පැදි | 1,000.00 |

5. සංශෝධිත, 2022 මැයි 06 දිනැති අංක 2278/21 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත්කරන ලද 2022 අංක 07 දරන ගෙවීම් ක්‍රම සඳහා වූ ආනයන පාලන රෙගුලාසි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

(i) සංශෝධිත 2022 අංක 07 දරන ගෙවීම් ක්‍රම සඳහා වූ ආනයන පාලන රෙගුලාසි යටතේ අනුමැතිය සඳහා රාජ්‍ය ආයතනයක් විසින් හෝ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් අනුමත සංවර්ධන ව්‍යාපෘති විසින් හෝ ඕනෑම රාජ්‍ය ආයතනයක් මගින් පිරිනමන ලද සංවර්ධන ව්‍යාපෘති විසින්, සෘජු භාවිතය සඳහා පමණක් සිදුකරනු ලබන ඉල්ලීම්, ආනයන හා අපනයන පාලක ජනරාල් විසින් භාණ්ඩාගාර ලේකම්ගේ නිර්දේශයට යටත්ව අවස්ථානුකූලව අනුමැතිය සඳහා සලකා බලනු ලැබේ.

(ii) 2022 ජූනි 24 දිනැති අංක 2285/19 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත්කරන ලද 2022 අංක 10 දරන ගෙවීම් ක්‍රම සඳහා වූ, ආනයන පාලන රෙගුලාසිවල **I වන උපලේඛනයෙන්**, පහත සඳහන් භාණ්ඩ හා ඒවාට අනුරූපී සටහන් මෙයින් ඉවත් කරනු ලැබේ.

| | *I තීරුව*<br>**ශීර්ෂ අංකය** | *II තීරුව*<br>**සංයෝජිත වර්ගීකරණ සංකේතය** | | *III තීරුව*<br>**විස්තරය** | *IV තීරුව*<br>**විවෘත ගිණුම් / භාණ්ඩ විකිණීමෙන් පසු මුදල් ගෙවීමේ පදනම සඳහා අවසර ඇත (OAP)** |
|---|---|---|---|---|---|
| 9 | **17.01** | | | **ඝන තත්ත්වයේ ඇති උක් හෝ බීට් සීනි සහ රසායනිකව පවිත්‍ර සුක්‍රෝස් (+).** | |
| | | 1701.99.00 | - | අනෙකුත් : | |
| | | 1701.99.10 | --- | 99.70 ට වඩා වැඩි හෝ සමාන ධ්‍රැවීය අගයක් සහිත (ICUMSA අගය <=60) උක් සීනි | OAP |

(iii) 2022 ජූනි 24 දිනැති අංක 2285/19 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත්කරන ලද 2022 අංක 10 දරන ගෙවීම් ක්‍රම සඳහා වූ, ආනයන පාලන රෙගුලාසිවල **I වන උපලේඛනයට**, පහත සඳහන් භාණ්ඩ හා ඒවාට අනුරූපී සටහන් මෙයින් ඇතුළත් කරනු ලැබේ.

| | *I තීරුව*<br>**ශීර්ෂ අංකය** | *II තීරුව*<br>**සංයෝජිත වර්ගීකරණ සංකේතය** | | *III තීරුව*<br>**විස්තරය** | *IV තීරුව*<br>**විවෘත ගිණුම් / භාණ්ඩ විකිණීමෙන් පසු මුදල් ගෙවීමේ පදනම සඳහා අවසර ඇත** (OAP) |
|---|---|---|---|---|---|
| 9 | **17.01** | | | **ඝන තත්ත්වයේ ඇති උක් හෝ බීට් සීනි සහ රසායනිකව පවිත්‍ර සුක්‍රෝස්** (+). | |
| | | 1701.99.00 | - | අනෙකුත් : | |
| | | 1701.99.20 | --- | 99.50 ට වඩා වැඩි හෝ සමාන සහ 99.70 ට වඩා අඩු ධ්‍රැවීය අගයක් සහිත (60 < ICUMSA අගය <=200) උක් සීනි | OAP |

EOG 08 - 0248

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.